# රිදී විහාරයේ සිතුවම් හායනය හා සංරක්ෂණ

ජේ.ඒ.ඉඳුනිල් කුමාරි ජයතිලක [1]

මෙම පර්යේෂණ නිබන්ධන මාතෘකාව පෙළ ගැසෙන්නේ ඓතිහාසික රිදී විහාරස්ථානයේ පවතින්නා වූ ඉපැරණි බිතු සිතුවම් හායනය හා සංරක්ෂණය සම්බන්ධයෙන් වේ. මේ අනුව වසර 2300කටත් වඩා පැරණි ඉතිහාසයක් පවතින මෙම විහාරස්ථානයේ මහනුවර යුගයට අයත්වන වටිනා සිතුවම් රාශියක් දැකගත හැකිය. මේ අනුව මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව ලෙස රිදී විහාරයේ සිතුවම් හායනය වී ඇත්තේ කෙබඳු ලෙසින් ද යන්න පිළිබඳව වේ. මේ අනුව උක්ත පර්යේෂණ ගැටළුව සහභාවී නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ අධ්‍යයනය කොට ඇත. එම ගැටළුව අනුව යමින් මෙම සිතුවම් හායනය වීමට බලපා ඇති හේතුකාරණා විමසා ඒ සඳහා සුදුසු සංරක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම මෙහි අරමුණ වේ. මෙම විහාරස්ථානයේ පවතින්නා වූ සිතුවම් අධ්‍යයනය කිරීමේ දී පෙනීගිය වැදගත් සාධකයන් ලෙස ශ්‍රී ලංකාවේ වෙනත් විහාරස්ථානයන් හි දැකිය නොහැකි ආකාරයේ සිතුවම් රාශියක් මෙහි පැවතීම වැදගත් වේ. එමෙන්ම එම සිතුවම් වර්තමානය වනවිට දැඩි ලෙසින් හායනයට ලක්ව ඇත. එහිදී ප්‍රධාන වශයෙන් ස්වභාවික, මානව හා සත්ව ක්‍රියාකාරකම් මත මෙම සිතුවම් හානි වී ඇති බවට සාධක පවතී. මෙම මාධ්‍යයන් ත්‍රිත්වය හේතු කොට ගෙන ඇති වන හානිය අවම කරගැනීම සඳහා සංරක්ෂණ ක්‍රමවේදයන් යොදා ගැනීම අනිවාර්යයෙන්ම කළයුතු කාර්යයක්ව පවතී. ඒ අනුව රසායනික සංරක්ෂණය, වායුගෝලීය පීඩන තත්ව පාලනය, මානව ක්‍රියාකාරකම් පාලනය, කෘමි නාශක යෙදීම වැනි සංරක්ෂණ ක්‍රමවේදයන් භාවිතය තුළින් මෙම සිතුවම් ආරක්ෂා කර ගැනීමට හැකියාව ඇත.

ප්‍රමුඛ පද : සංරක්ෂණය, හායනය, රිදී විහාරය, රසායනික සංරක්ෂණය

---

[1] සහකාර කථිකාචාර්ය , පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, induniljayathilakayahoo.com